Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පුරවැසි අධ්‍යාපනය

3 වාරය සතිය - 10

ශ්‍රේණිය : 6

සකස් කිරීම : මාවනැල්ල කලාපය,

__පුණරීක්ෂණය__

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) නිවස හැරුණු විට ඔබට වඩාත් හුරු පුරුදු පරිසරය වන්නේ,
   i. ආරෝග්‍ය ශාලාවයි  ii. ඔබේ පාසලයි
   iii. ප්‍රජා ශාලාවයි.  iv. පන්සලයි

2) ඔබේ පාසලේ ඉතිහාසය දැන ගැනීමට උපකාරී වන වඩාත්ම උචිත මූලාශ්‍රයකි,
   i. පාසලේ නම  ii. පාසලේ ගොඩනැගිලි සංඛ්‍යාව
   iii. පාසලේ කාල සටහන  iv. පාසලේ විවිධ ස්ථානවල ඇති සමරුඵලක.

3) "නිදහස් අධ්‍යාපනයේ පියා" යන නාමයෙන් පිදුම් ලැබුවේ,
   i. සේනක බිබිලේ මැතිතුමාය.
   ii. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා ය.
   iii. ආතර් වී දියෙස් මැතිතුමාය.
   iv. ආචාර්ය ප්‍රේමදාස උඩගම මැතිතුමා ය.

4) ඔබ පාසල අයත් දිස්ත්‍රික්කය වන්නේ,
   i. කොළඹ දිස්ත්‍රික්කය.  ii. ගම්පහ දිස්ත්‍රික්කය.  iii. රත්නපුර දිස්ත්‍රික්කය.  iv. කළුතර දිස්ත්‍රික්කය.

5) රටේ පරිපාලන බෙදීම අනුව කුඩාම පරිපාලන ඒකකය වන්නේ,
   i. පළාතයි  ii. ග්‍රාම නිළධාරී කොට්ඨාසයයි.
   iii. දිස්ත්‍රික්කයයි  iv. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි.

- **ප්‍රශ්න අංක 6 - 10 දක්වා ඇති වගන්ති නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

6) ඖෂධ වේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්ය වරයා වූයේ වෛද්‍ය නන්දදාස කෝදාගොඩ මහතාය. ( )

7) පාසල් අධ්‍යාපනය සෑම දරුවෙකුගේම අයිතිවාසිකමකි. ( )

8) පාසල, පුද්ගලයාගේ සංවර්ධනයට පමණක් නොව සමාජයේ සංවර්ධනයටද දායක වන ආයතනයකි. ( )

9) අප ප්‍රයෝජනයට ගන්නා බොහෝ සම්පත් සීමිතය. ( )

10) අතිශය නාගරික සංකීර්ණ පරිසරයක් සහිත බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාව පිහිටා ඇත. ( )